# ලංකා බැංකුව

## ලංකාවේ "අංක 1" බැංකුව හා එක්ව ඔබටත් දැයටත් සෞභාග්‍යමත් අනාගතයක් නිර්මාණය කර ගන්න

බැංකුකරණය වෘත්තියෙන් ඉදිරියට යාමට අපේක්ෂා කරන තරුණ, උද්‍යෝගිමත්, ප්‍රතිඵල කරා දිශාභිමුඛ, සුදුසුකම් සහිත පුද්ගලයන්ගෙන් පහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරණ අභ්‍යාසලාභී

### යෝග්‍යතා නිර්ණායක

➢ **ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.**

➢ **සුදුසුකම් සහ පළපුරුද්ද**

අ) පහත සඳහන් විෂයයක / විෂයය ක්ෂේත්‍රයක, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින්, අවම වශයෙන් දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් හෝ ලකුණු 4.0 ක උපරිමයකින් අවම ලකුණු 3.5 ක ශ්‍රේණි ලකුණු සාමාන්‍යයක් (GPA) සහිත උපාධියක් ලබාගෙන තිබීම.

ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය, ගණිතය, ගිණුම්කරණය, බැංකුකරණය, මූල්‍ය, වාණිජ්‍යය, ව්‍යාපාර පරිපාලනය, කළමනාකරණය (රාජ්‍ය / මූල්‍යමය / ගිණුම්කරණය / ව්‍යාපාර), අලෙවිකරණය, මානව සම්පත්, ඉංජිනේරු විද්‍යාව, පරිගණක විද්‍යාව, භෞතික විද්‍යාව, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, නීතිය, අන්තර්ජාතික ව්‍යාපාරකරණය, තක්සේරුකරණය, කාර්මිකකර්මය හෝ බැංකුකරණය හා මූල්‍යයට අදාළ වෙනත් ක්ෂේත්‍රයක්

**හෝ**

ආ) ඉහත (අ) ඡේදයෙහි සඳහන් ඕනෑම විෂයයක / විෂයය ක්ෂේත්‍රයක, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග ශාස්ත්‍රපති / විද්‍යාපති හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබාගෙන තිබීම

**හෝ**

ඇ) බැංකුවක හෝ පිළිගත් මූල්‍ය ආයතනයක අවම වශයෙන් වසරක විධායක මට්ටමේ පළපුරුද්දක් සහිතව ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) හෝ එක්සත් රාජධානියේ වරලත් බැංකුකරුවන්ගේ ආයතනයේ (CIB) ආශ්‍රිත සාමාජිකයකු වීම

**හෝ**

ඈ) පිළිගත් ආයතනයක වසර 02 ක විධායක මට්ටමේ පළපුරුද්ද සමග පහත සඳහන් වෘත්තීය ගිණුම්කරණ ආයතනයක ආශ්‍රිත ඉහත (අ) ඡේදයෙහි සඳහන් ඕනෑම විෂයයක / විෂයය ක්ෂේත්‍රයක, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග පහත සඳහන් ඒවා අතරින් එකක පූර්ණ සුදුසුකම් ලබා තිබීම (අවසන් පරීක්ෂණය සමත් වීම)

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය (ICA-SL)
- වරලත් සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ සංගමය (ACCA-UK)
- CFA ආයතනයේ වරලත් මූල්‍ය විශ්ලේෂක පාඨමාලාව (CFA-USA)
- එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනය (CIMA - UK)
- එංගලන්තයේ සහ වේල්ස්හි වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය (ICA - EW)

**හෝ**

ඉ) අවසන් පරීක්ෂණයේ දී ගෞරව සාමාර්ථයක් සහිතව, බැංකුවක හෝ පිළිගත් මූල්‍ය ආයතනයක අවම වශයෙන් වසර 02 ක විධායක මට්ටමේ පළපුරුද්ද සහිත නීතිඥවරයකු / වරියක වීම.

➢ **වෙනත් සුදුසුකම්**

- ධනාත්මක චින්තනයෙන් යුතුව බැංකුවේ අරමුණු ළඟා කරගැනීමට කැපවීමෙන් යුතුව කටයුතු කිරීම.
- පීඩනයන් යටතේ වුවද ඵලදායී ලෙස කටයුතු කිරීමේ හැකියාව.
- නායකත්ව ගුණාංග සහිතවීම.
- අන්තර් පුද්ගල කුසලතා සහ කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ හැකියාව.
- තොරතුරු තාක්ෂණය පිළිබඳ සාක්ෂරතාව.
- ඉංග්‍රීසි සහ සිංහල / දෙමළ භාෂාවන් පිළිබඳ ප්‍රවීණතාවය.
- බැංකුවේ අවශ්‍යතාවය මත දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

➢ **වයස**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 හෝ ඊට අඩු විය යුතුය.

### නියමයන් හා කොන්දේසි

- පුහුණු කාල සීමාව වසර දෙකක් (02) වන අතර පුහුණු කාලය තුළ රු. 75,000/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.
- මෙම තනතුර බැංකු සේවයේ සාමාන්‍ය බැංකු සේවා ප්‍රවාහයේ (විවෘත සේවය) පොදු නියමයන් හා කොන්දේසිවලට යටත් වේ.
- පුහුණු කාලසීමාව තුළ බැංකුව අපේක්ෂා කරනු ලබන අවශ්‍යතා සපුරාලීම මත ස්ථිර සේවයෙහි විධායක නිලධාරී ශ්‍රේණියෙහි සේවය තහවුරු කරනු ලැබේ.
- කාර්යාල වේලාවට අමතරව සහ සති අන්ත / නිවාඩු දින වල සේවය කිරීම අපේක්ෂා කෙරේ.

### තෝරා ගැනීමේ පටිපාටිය

තරඟ විභාගයකින් අනතුරුව ලැයිස්තුගත කරනු ලබන (short listed) අපේක්ෂකයන් සඳහා පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින්

### අයදුම් කිරීමේ පටිපාටිය

අපගේ වෙබ් අඩවිය වන www.boc.lk ("Careers" තීරය) හරහා 2020 දෙසැම්බර් මස 19 දින හෝ ඊට පෙර ඔබේ ජීවදත්ත එවිය යුතු අතර එම "අයදුම්පතෙහි යොමු අංකය" ඔබේ අනාගත පරිශීලනය සඳහා සුරැකිව තබා ගන්න.

ඉහත ඉල්ලුම් කිරීමේ පටිපාටියට අමතරව වෙනත් කිසිදු මාර්ගයකින් ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් නිසා භාරගනු නොලැබේ.

ඉහත සඳහන් අපේක්ෂිත සුදුසුකම් රහිත හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන ලද අයදුම්කරුවන් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**මානව සම්පත් අංශය,**
**ලංකා බැංකු,**
**ප්‍රධාන කාර්යාලය, කොළඹ 01.**

***කිසියම් අයුරකින් හෝ බලපෑම් සිදු කිරීම වහාම නුසුදුසු බවට පත් කිරීමට හේතු වනු ඇත.***

***තෝරාගත් අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.***

ADS DETSILS